**ශීර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(**2**) වගන්තිය ප්‍රකාරව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 දෙසැම්බර් 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/19 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණය කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනිමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීමට හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන් වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්න ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට අයත් ස්ථාන 09 ක ක්‍රීඩාංගන සහ නේවාසිකාගාර ස්ථාපිත කර ඇති අතර මෙම වත්කම් ගිණුම් ගත කර නොතිබුණි. | මෙම වත්කම් අදාළ වත්කම් ලේඛනයන්හි ගිණුම්ගත කිරීමට ක්‍රියාකළ යුතු වීම. | මාතර කොටවිල ක්‍රීඩාංගනයේ සහ කළුතර බණ්ඩාරගම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය පිහිටි ඉඩම් වල අයිතිය හා පොළොන්නරුව දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය පිහිටි ඉඩමේ අයිතිය පවරා ගැනීම් කටයුතු ආරම්භ කර ඇත. දෙපාර්තමේන්තුව පිහිටි ඉඩම් 04 ක් දෙපාර්තමේන්තුවට පවරා දීමට අවශ්‍ය කටයුතු ඉටු කර දෙන ලෙස තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් වෙතින් ඉල්ලීම් කර ඇත. එමෙන්ම බෙලිඅත්ත ක්‍රීඩාංගනය බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව වෙත පැවරීමට ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත යෝජනා කර ඇත. |

### 1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති, රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග 7 (x) සහ 7 (xii) | ජාතික ක්‍රීඩා සංගම් විසින් එළඹෙන වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර එකී ක්‍රියාකාරී සැලැස්ම පවත්නා වර්ෂය අවසන් වීමට මාස තුනකට පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2019 වර්ෂය සඳහා ජාතික ක්‍රීඩා සංගම්වල ක්‍රියාකාරී සැලසුම් ලබා ගැනීමට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. | ජාතික ක්‍රීඩා සංගම් නියෝග ප්‍රකාරව ක්‍රීඩා සංගම් මගින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමේදී අදාළ ජාතික සංගමය/ සම්මේලනය මගින් ඉදිරිපත් කරනු ලබන වියදම් ඇස්තමේන්තුව පිළිබඳව සලකා බලා, ගරු ක්‍රීඩා අමාත්‍යතුමන්, අමාත්‍යාංශ ලේකම් හෝ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව මෙම මූල්‍ය ප්‍රතිපාදනයන් ලබාදීමට කටයුතු කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග 7 (x) | ක්‍රීඩා සංගම් සමග අවබෝධතා ගිවිසුම්වලට එළඹීමට කටයුතු කිරීමකින් තොරව ගුවන් ටිකට්පත් හා උපකරණ මිලදී ගැනීම ඇතුළු වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.204,001,938 ක් ක්‍රීඩා සංගම් 35 ක් වෙත ප්‍රදානය කර තිබුණි. | ජාතික ක්‍රීඩා සංගම් නියෝග ප්‍රකාරව ජාතික ක්‍රීඩාසංගම් සඳහා මූල්‍ය උපකාර ලබාදීමේදී අවබෝධතා ගිවිසුම්වලට එලබීමට කටයුතු කළ යුතු වීම. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ ජනරාල් විසින් මේවන විටත් අධ්‍යක්ෂ (ක්‍රීඩා) වෙත උපදෙස් ලබාදී ඇති බවත්, ඒ අනුව ඉදිරියේදී සියළු ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලන දැනුවත් කර මෙම අඩුපාඩු නිවැරදි කර ගන්නා බවත් කාරුණිකව දන්වමි. |
| (ඇ) | 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග අංක 7 (vi) ඡේදය | (i) අන්තර් ජාතික ක්‍රීඩා සම්මේලනය විසින් නිශ්චිතව දක්වන ලද තෝරා ගැනීමේ නිර්නායක නිසිලෙස සැලකිල්ලට ගනිමින් ක්‍රීඩකයින් තෝරා ගැනීම සඳහා සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සම්බන්ධීකරණයෙන් යුක්තව ජාත්‍යන්තර හෝ කලාපීය ක්‍රීඩා ඉසව් නියෝජනය කිරීම වෙනුවෙන් කණ්ඩායම තෝරා ගැනීම සඳහා විනිවිදභාවයෙන් යුත් තේරීම් නිර්නායකයන් සකස් කිරීම, ජාතික ක්‍රීඩා සංගම් විසින් සිදුකළ යුතු වුවත්, ජාතික ක්‍රීඩා සංගම් විසින් එසේ සිදුකළ බවට තොරතුරු විගණනයට අනාවරණය නොවිය. තවද නිර්ණායකයන් සකස් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ක්‍රීඩා සංගම්වල කටයුතු පරීක්ෂා කර බලා එම කටයුතු මෙහෙයවීමට හෝ අධීක්ෂණය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බවට තොරතුරු විගණනයට අනාවරණය නොවීය. | ජාතික තේරීම් කමිටු සඳහා ජාතික ක්‍රීඩා සංගම් විසින් පිළියෙල කරන ලද තේරීම් නිර්නායකයන් සම්බන්ධයෙන් සම්බන්ධිකරණ කටයුතු සිදු කිරීම, වාර්තා රැස්කිරීම හා නියාමන කිරීමේ කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදුකළ යුතු වීම. | ක්‍රීඩා ඉසව් සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරාගැනීමේදී යම් ආකාරයෙන් අසාධාරණයක් සිදු වුවහොත් ඒ ඒ ක්‍රීඩා සංගම්/සම්මේලන අධීක්ෂණ නිලධාරීන් එම අසාධාරණය ගැන කරුණු සොයා බලා ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග ගෙන සුදුසු ආකාරයෙන් කටයුතු කරන බැවින් ක්‍රීඩා සංගම්/සම්මේලන කටයුතු පරීක්ෂා කර බලා, කටයුතු මෙහෙයවීම අධීක්ෂණය කිරීම ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සිදු වේ. |
| | | (ii) 2017 වර්ෂය සඳහා ජාතික සංගම් 37 ක්, 2018 වර්ෂය සඳහාද සංගම් 25 ක් හා 2019 වර්ෂය සඳහා සංගම් 35 ක් ජාතික තේරීම් කමිටු පත්කර නොතිබුණද ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ වලට සහභාගි වීම සඳහා ගුවන් ටිකට් පත් මිලදී ගැනීම හා තරඟ පැවැත්වීමේ වියදම් වෙනුවෙන් 2017, 2018 හා 2019 වර්ෂවල පිළිවෙලින් රු.33,028,040 ක් රු.1,023,330 ක් හා රු.17,700,623 ක් ක්‍රීඩා සංවර්ධන | දේශිය හා විදේශීය තරඟ සඳහා ක්‍රීඩකයින් තෝරා ගැනීම සඳහා වාර්ෂික තේරීම් කමිටු පත් කිරීම, එහි කටයුතු අධික්ෂණය, මෙහෙයවිම හා නියාමනය කිරීම තුලින් දෙපාර්තමේන්තුවේ අරමුදල් සුදුසුකම්ලත් | සියලුම කරුණු සලකා බලා මින් ඉදිරියට මෙවැනි අඩුපාඩු මඟහරවා ගනිමින් කටයුතු සිදු කරන බවද කාරුණිකව දන්වා සිටිමි. |

| | |
|---|---|
| දෙපාර්තමේන්තුව විසින් එම ජාතික ක්‍රීඩා සංගම් වෙනුවෙන් වැය කර තිබුණි. | ක්‍රීඩකයින් වෙනුවෙන් යොදන බවට තහවුරු කරගත යුතුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබුණු අග්‍රිම ඇස්තමේන්තු අනුව ලබා ගැනීමට අපේක්ෂා කල හා ඉල්ලුම් කළ අග්‍රිම රු.4,832,159,000 ක් වූ අතර භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු අග්‍රිම රු.1,824,270,000 ක් වී තිබුණි. මේ හේතුවෙන් යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් නිසි ලෙස ඉටුකළ නොහැකි වී තිබුණි. | සැලසුම් කළ පරිදි අග්‍රිම ලබා ගෙන අදාළ කාර්යන් නිම කළ යුතු වීම. | දකුනු ආසියානු ක්‍රීඩා උළෙල සහ ජාතික මහා ක්‍රීඩා උළෙල 2019 වර්ෂයේ අවසාන භාගයේදි පැවැත්වූ අතර එය වර්ෂය ආරම්භයේදි හෝ මැදදී පැවැත්වීමට හැකියාවක් නොමැත. වර්ෂය ආරම්භයේ සිටම අක්මුදල් අප විසින් ඉල්ලුම් කලද සැලසුම් කල පරිදි ලැබී නොතිබුණි. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ මූලධන වැය විෂයයන් සඳහා සලසා තිබුණු රු.1,461,000,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.280,407,661 ක් හෙවත් සියයට 19 ක් ඉතිරි කර තිබුණි. | කාර්යභාරය ඉටු කිරීම ආරම්භවන කාල වකවානු නිශ්චය කර වර්ෂය තුළ ඉටු කළ හැකි කාර්ය ප්‍රමාණයට සරිලන පරිදි ප්‍රතිපාදන සලසා ගත යුතු වීම. | ව්‍යාපෘති ක්‍රියාත්මක කලද අවශ්‍යා පරිදි අක්මුදල් නොලැබීම නිසා රු. මිලියන 538 ක ගෙවිය යුතු බිල්පත් 2019.12.31 දිනට දෙපාර්තමේන්තුව සතුව පැවතුනි. |
| (ආ) | වැය විෂයයන් 13 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 97 දක්වා අතර පරාසයක පැවතුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | අයවැය චක්‍රලේඛ අංක 2019/04 අනුව ඇතැම් වැය විෂයන්වල වියදම් දැරීම සීමා කිරීම මගින් වියදම් කළමණාකරණය කල බැවින් මෙම වැය විෂයන්වල ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |

**2.3** **බැරකම් හා බැඳීම්වලට එළඹීම**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ එක් වැය විෂයයක් යටතේ සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 600,000,000 ක් වූ අතර වර්ෂය අවසාන වන විට එයින් රු.578,719,272 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.21,280,727 ක් ඉතිරි වී තිබුණ ද ඉතිරිය ඉක්මවා රු.49,936,273 ක බැරකම් වලට එළඹ තිබුණි. | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 (ඈ) ඡේදයට අනුකූලව බැඳීම්වලට හා බැරකම් වලට එළඹිය යුතු වීම. | නේපාලයේ පැවති 13වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල සඳහා ඇතිකරගත් බැඳීම් හේතුවෙන් රු. 49,936,273ක ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවූ බැරකමක් පවතී. |
| (ආ) | එක් වැය විෂයයක් යටතේ එළඹ තිබුණු රු.32,401,954 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණ අතර ගිණුම් පියවීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත්කරන ලද කමිටුව විසින් එම බැරකම් වලින් රු.20,544,471 ක් ගෙවීම සඳහා නිර්දේශ කර නොතිබුණි. | බැරකම් නිසිලෙස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට ක්‍රියාකළ යුතු වීම. | ගිණුම් පියවීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම් සඳහා වූ කමිටුව විසින් එම මුදලින් රු. මිලියන 20.5ක මුදලක් ප්‍රමාද වී බිල්පත් ඉදිරිපත් කිරීම හේතුවෙන් නොගෙවන ලෙස නිර්දේශ කර තිබුණි. ඒ අනුව ගෙවීම් සිදු කර නොමැත. |
| (ඇ) | සැපයුම් ආයතනයකට ගෙවිය යුතු රු.7,152,080 ක් වූ බැරකම් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි. | - එම - | 2019.12.31 දිනට අදාළ ආයතනය විසින් අත්තිකාරම් මුදල් පමණක් ඉල්ලා තිබූ අතර සැපයුම සම්පූර්ණ කර නොතිබුණි. |

**2.4 තැන්පතු ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. 29,020,437 ක් වූ තැන්පතු ශේෂ 36 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකළ යුතු වීම. | තැන්පතු නිදහස් කිරිම සඳහා ප්‍රමාණවත් අක්මුදල් නොලැබුනු අතර, අක්මුදල් ලද වහාම නිදහස් කිරිමට කටයුතු කරනු ලැබේ. |

**2.5 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් සැසඳුම් ප්‍රකාශය.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.100,250 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 5 කට වැඩි කාල පරාසයක් ගත වී තිබුණද, අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු වීම. | අයකර ගැනීමට නොහැකි වී ඇත. භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගෙන කපා හැරීමට කටයුතු කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2016 දෙසැම්බර් 23 දින ගබඩාවට භාර ගෙන තිබූ රු.12,995,000 ක් වටිනා බර ඉසිලීමේ ඉලෙක්ට්‍රොනික් විනිශ්චය සංඥා පද්ධති උපකරණය ඇනවුම් කිරීමේදී සිදුවූ දෝෂයක් මත සැපයුම් ආයතනය අත්‍යාවශ්‍ය අයිතම සපයා නොමැති වීම හේතුවෙන් ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි. එම උපකරණ දින 04 ක් සඳහා රු.220,000 මුදලකට කුලී පදනම මත ලබාගෙන එක් තරඟාවලියක විනිශ්චය සඳහා පමණක් යොදා ගෙන තිබුණි. | රජය සතු වත්කම් කාර්යක්ෂමතාවය කින් හා ඵලදායි ලෙස භාවිතා කළ යුතු වීම. | එකඟ වෙමි. මෙම උපකරණ මිලට ගැනීමේදී ඒ සඳහා අවශ්‍ය වන Digital Screen මිලට ගෙන නොමැති බැවින් ඒවා කුලී පදනම මත සපයාගෙන භාවිතා කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තුවට අයත් වෑන් රථයක් ක්‍රීඩා අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකය වෙත 2019 ජනවාරි 21 දින තාවකාලිකව මුදාහැර තිබුණද 2020 ඔක්තෝබර් වන විටද දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකිරීමට බාධාවක් නොවන පරිදි එම වත්කම් මුදා හැරීමට කටයුතු කළ යුතු වීම. | මෙම වෑන් රථය අමාත්‍යාංශයේ මාධ්‍ය අංශය සඳහා යොමු කර ඇති බැවින් නිදහස් කිරීමට නොහැකි බවට අමාත්‍යාංශ ලේකම් විසින් 2020.01.17 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත. |
| (ඇ) | ක්‍රීඩා අමාත්‍යාංශයට අයත් ජීප් රථයක් 2015 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුව විසින් ලබාගෙන තිබුණි. | බාහිර පාර්ශවයන්ගෙන් ලබා ගෙන ඇති වත්කම් විධිමත් පරිදි දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට ක්‍රියාකළ යුතුය. | අධ්‍යක්ෂ ජනරාල්ගේ පරිහරණය සඳහා දෙපාර්තමේන්තුවේ සුදුසු වාහනයක් නොමැති බැවින් 2015 වර්ෂයේ සිට ක්‍රීඩා අමාත්‍යාංශයට අයත් ජීප් රථයක් දෙපාර්තමේන්තුවේ භාවිතය සඳහා ලබා ගෙන ඇත. |

**3.2 පළාත් හා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදි කිරීම**

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් සහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම යටතේ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 12 ක් සහ පළාත් ක්‍රීඩා සංකීර්ණ 5 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 675 ක ප්‍රතිපාදන සලසා තිබුණ අතර සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 12 ක් සහ පළාත් ක්‍රීඩා සංකීර්ණ 05 ක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඒ සඳහා රු.මිලියන 125 ක් වැය කර තිබුණි. එයින් දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 3 ක වැඩ අවසන් කර තිබුණු අතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 9 ක සහ පළාත් ක්‍රීඩා සංකීර්ණ 5 හි වැඩ අවසන් කර නොතිබුණි. | ඉදිකිරීම් සඳහා නියමිත කාල රාමුව නිවැරදිව සැලසුම් කළ යුතු වීම හා සැලසුම් කළ කාර්යභාරයන් නිම කර ගැනීම සඳහා ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය හා නියාමනය සිදුකළ යුතු වීම. | දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 04 ක් 2021 වර්ෂයේ ප්‍රතිපාදන මත වැඩ නිම කිරීමට නියමිතය. දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 03 මේ වන තෙක් ඉදිකිරීම් ආරම්භ කර නොමැත. |
| (ආ) | දිස්ත්‍රික් 15 ක ක්‍රීඩාපිටි 52 ක් සංවර්ධනය සඳහා රු.මිලියන 475 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර 2016, 2017 හා 2018 වර්ෂවල ආරම්භකර තිබුණු ක්‍රීඩාපිටි 38 ක් සඳහා රු.240,105,000 ක ප්‍රතිපාදන සලසාගෙන එයින් ක්‍රීඩාපිටි 35 ක වැඩ අවසන් කර තිබුණි. | සැලසුම් කළ කාර්යභාරය ඉටු කිරීමට අවශ්‍ය අනෙකුත් සැලසුම් හා කාල රාමුව නිවැරදිව සැලසුම් කළ යුතු වීම. | දිස්ත්‍රික්ක 15 ක් සඳහා ක්‍රීඩාපිටි 52 ක් සංවර්ධනය කර ඇති බව පිළිගන්නා අතර, 2016,2017, 2018 වර්ෂවල ක්‍රීඩාපිටි 38 ක් වැය ආරම්භ කර ඉන් 35 ක වැඩ අවසන් බව පිළිගනිමි.<br>සමාලෝචිත වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘති 8ක වැඩ |

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වැඩ ආරම්භ කරන ලද ක්‍රීඩාපිටි 14 ක් සඳහා රු.127,178,000 ක ප්‍රතිපාදන සලසාගෙන ක්‍රීඩාපිටි 8 ක වැඩ අවසන් කර තිබුණු අතර ක්‍රීඩාපිටි 5 ක වැඩ අවසන් කර නොතිබුණි. එසේම රු.6,068,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු එක් ක්‍රීඩාපිටියක වැඩ ආරම්භ කර නොතිබුණි. | | අවසන් කල අතර, වැඩ ප්‍රමාද වු ක්‍රීඩාපිටි 5න් ක්‍රීඩා පිටි 2 ක ඉදිකිරිම් අවසන් අදියරේ පවතී. රටේ ඇතිවූ කොවිඩ් වසංගත රෝගී තත්වය හේතුවෙන් අවසන් කිරීම ප්‍රමාද වූ ක්‍රීඩාපිටි 2 ක වැඩ 2021 වර්ෂයේදී සම්පූර්ණයෙන්ම නිම කිරීමට නියමිතය. ඉතිරි ව්‍යාපෘතියේ පළමු අදියරේ වැඩ අවසන් කිරීමට නියමිතය. වැඩ ආරම්භ නොකළ ව්‍යාපෘතිය 2021 වර්ෂයේ නිම කිරීමට නියමිතය. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

--------------------------

පහත සඳහන් නිරීක්ෂණන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ---------- | ----------------------------- |
| **(අ)** 13 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙලට සහභාගිවන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ක්‍රීඩා උපකරණ හා ක්‍රීඩා ඇඳුම් මිලදී ගැනීම සඳහා ක්‍රීඩා සංගම් 27 කින් ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබුණු අතර ක්‍රීඩා සංගම් 20 ක් සඳහා 2019 ජුලි මස රු.25,773,000 ක් ලබාදී තිබුණි. ඊට අමතරව ඇස්තමේන්තු ඉදිරිපත් නොකළ එක් ක්‍රීඩා සංගමයක් විසින් මිලදිගත් ක්‍රීඩා භාණ්ඩ සඳහා දෙපාර්තමේන්තුව විසින් රු.4,863,468 ක් ලබාදී තිබුණි. ඇස්තමේන්තු ඉදිරිපත්කර තිබුණු ක්‍රීඩා සංගම් 03 ක හා ඇස්තමේන්තු ඉදිරිපත් නොකළ ක්‍රීඩා සංගම් 03 ක ක්‍රීඩකයින් දකුණු ආසියානු ක්‍රීඩා උළෙලට සහභාගිවී තිබුණද ක්‍රීඩා උපකරණ හා ඇඳුම් මිලදී ගැනීම සඳහා මුල්‍ය ප්‍රතිපාදන ලබාදී නොතිබුණි. | ක්‍රීඩා සංගම් වෙත උපකරණ හා අරමුදල් ලබාදිමේදී අදාළ අවශ්‍යතාවයන් පිළිබඳ සැලකිල්ලට ගතයුතු අතර අරමුදල් ලබාදීමෙන් පසු නියමිත කාර්ය සඳහා යොදවා තිබේදැයි පසුවිපරම් සිදුකිරීම හා ඒ සම්බන්ධ සම්බන්ධිත ලියවිලි ලබා ගැනීම මගින් වියදම් නියමිත පරිදි සිදුකර තිබේදැයි සනාථ කර ගත යුතුවීම. එසේම නියමිත පාර්ශවයන් වෙත උපකරණ හා ඇඳුම් ලබාදී තිබේදැයි ද තහවුරු කරගත යුතු වීම. | ක්‍රීසංදෙ/අවි/01/05/01/17 දරන ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන වාර්තාව අනුව ඡේදය පිළියෙල කර ඇත. |
| **(ආ)** ක්‍රීඩා සංගම් 08 ක් වෙත ලබාදුන් රු.8,712,000 ක් සඳහා අදාළ මිලදී ගැනිම් සිදුකළ බව සනාථවන බිල්පත්වල ඉදිරිපත් කර නොතිබුණි. ක්‍රීඩා සංගම් 3 ක් අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ නියමිත ප්‍රමාණයෙන් මිලදී ගෙන නොතිබුණු අතර ඒ අනුව වියදම් නොකළ රු.412,794 ක් නැවත පියවීමට කටයුතු කර නොතිබුණි. | | |

| | | |
|---|---|---|
| ක්‍රීඩා සංගමයක් වෙත ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම සඳහා ලබාදුන් රු.627,000 ක් පුහුණුකරුවන්ගේ වැටුප් ගෙවීමට හා ක්‍රීඩාගාර වෙන් කිරීම් ගාස්තු ගෙවීමට වැය කර තිබුණු අතර තවත් ක්‍රීඩා සංගමයක් වෙත ලබාදුන් රු.3,700,000 ක මුදලින් රු.2,215,528 ක් වැය නොකර වර්ෂයක කාල ප්‍රමාදයකින් පසු 2020 ජූලි 15 දින ආපසු පියවා තිබුණි. අතුරු සංගමයක් ලෙස ක්‍රියාත්මකවන ක්‍රීඩා සංගමයක් වෙත 2019 ජූලි මස ලබාදී තිබුණු රු.400,000 ක් 2019 අගෝස්තු 09 දින ආපසු දෙපාර්තමේන්තුව වෙත තැන්පත් කර තිබුණි. | අරමුදල් ලබාදීමෙන් පසු නියමිත කාර්ය සඳහා යොදවා තිබේදැයි පසුවිපරම් කළ යුතු වීම. | ක්‍රීසංදෙ/අවි/01/05/01/17 දරන ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන වාර්තාව අනුව ඡේදය පිළියෙල කර ඇත. |

## 3.4 ප්‍රසම්පාදන

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට අයත් නේවාසිකාගාර 02 සඳහා එක් යන්ත්‍රයක් රු.5,290,000 ක් වූ විදුලි ජනක යන්ත්‍ර 02 ක් මිලදී ගැනීමේ පිරිවැය රු.මිලියන 10 ට අඩු ලෙස සලකා ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ඡේදය සංශෝධිත 2018 ජූලි 09 දින අංක 34 ඇමුණුම පරිදි වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණි. නමුත් මුළු පිරිවැය රු.මිලියන 10 ඉක්මවන මෙම මිලදී ගැනීම සඳහා විවෘත මිලගණන් කැඳවීම සිදුනොකර දුරකථන නාමාවලිය භාවිතා කර සැපයුම්කරුවන් 05 දෙනෙකු පමණක් තෝරා ගෙන මිල ගණන් කැඳවා තිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ඡේදය සංශෝධිත 2018 ජූලි 09 දින අංක 34 ඇමුණුම පරිදි කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී එවැනි ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීමේදී ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය අනුගමනය කරන බවට සඳහන් කරමි. |

**3.5** **අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මායාකඩවර දූන්වත්ත මහජන ක්‍රීඩාංගනයේ ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම සඳහා මුළු ඇස්තමේන්තුව රු. 6,000,000 ක් වූ අතර ඉදිකිරීම් කටයුතු සඳහා රු. 6,843,755 ක් වැය කර තිබුණි. මෙහි ඉදිකිරීම් කටයුතු සඳහා රු. 6,333,081 ක් වූ අගයකට කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම් ගතව 2017 පෙබරවාරි 19 දින වැඩ අවසන් කළ යුතු වුවත් වසර 01 ක ප්‍රමාදයකින් පසු එනම් 2018 මාර්තු 31 දින එහි වැඩ අවසන් කර තිබුණි. නමුත් 2020 දෙසැම්බර් 15 වන දින වන විට ඉදිකිරීම් සිදුකර වසර 02 ක් හා මාස 05 ක් ගත වී ඇතත් ප්‍රේක්ෂකාගාරය කිසිදු පාර්ශවයක් වෙත නිත්‍යානුකූලව භාර දී නොතිබුණි. ප්‍රේක්ෂකාගාරයේ සිට ක්‍රීඩා පිටිය නැරඹීය හැකි වන ලෙස ප්‍රේක්ෂකාගාර ගොඩනැගිල්ල ක්‍රීඩාංගණය දෙසට මුහුණ ලා ඉදි කර නොතිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා විධිමත් ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබීම සහ විධිමත් පරිදි ඉදිකිරීම් සැලසුම් කර නොමැති බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති මගින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවන ලෙස ව්‍යාපෘති ඉදිකිරීම් සැලසුම් කළ යුතු වීම. | දැනට මෙම ක්‍රීඩාපිටිය සම්බන්ධව අදාළ පාර්ශවයන් සමග සාකච්ජා කර නෛතිකව පසුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශිය සභාව වෙත භාරදීමට කටයුතු යොදා ඇත. එසේම ජලය හා විදුලිය ලබා ගැනීමට අදාළ කටයුතු කර ඇත. |
| (ආ) | කටුපොත පොල්පිටිය මහජන ක්‍රීඩාංගනයේ ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම සඳහා රු. 6,832,450 ක අගයකට කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම් ගතව තිබුණි. ප්‍රේක්ෂකාගාරයේ වැඩ කටයුතු 2017 මාර්තු 31 දින වන විට අවසන් කර තිබුණද, ඉදිකිරීම් කටයුතුවල විශාල ප්‍රමාණයක පැවති අඩුපාඩු වැඩ නිම කර මාස 21 කට පසුව එනම් 2019 දෙසැම්බර් 17 දින ප්‍රේක්ෂකාගාරය කුලියාපිටිය ප්‍රාදේශීය සභාව වෙත භාරදී තිබුණි. ප්‍රේක්ෂගාරයේ හඳුනාගත් අඩුපාඩු නැවත සකස් කළ බවට හා තාක්ෂණ නිලධාරි සහතිකයක් 2020 දෙසැම්බර් 09 දිනට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අපේක්ෂිත කාලවකවානු තුළ ව්‍යාපෘති නිමකිරීමට හැකිවන පරිදි හා අවශ්‍යතා හඳුනාගෙන සැලැසුම් විධිමත් පරිදි පිළියෙල කර නියමිත කාල රාමුව ඇතුළත නියමිත ප්‍රමිතියට අනුව ඉදිකිරීම් කටයුතු නිමකිරීමට හැකිවන පරිදි ව්‍යාපෘති කළමනාකරණය හා නියාමනය කළ යුතු වීම. | අඩුපාඩු සකස් කර මේවන විට කුලියාපිටිය ප්‍රාදේශීය සභාවට භාරදී ඇති බව දන්වමි. |

## 3.6 මුදල් නිදහස් කර ඇතත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කුලියාපිටිය සුභාරති විද්‍යාලයේ ක්‍රීඩාපිටිය ඉදිකිරීමට අදාළ මුළු ඇස්තමේන්තු මුදල රු. 6,535,000 ක් වූ අතර, කොන්ත්‍රාත්කරු සමඟ රු. 5,545,525 ක් වූ අගයකට ගිවිසුම් ගතවී කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මෙම ක්‍රීඩාපිටිය අසලින් ගලාබසින ඔයේ ගංවතුර තත්ත්වයක් ඇති වීම හේතුවෙන් ක්‍රීඩාපිටිය වටා ඉදිකර තිබූ බැම්ම සම්පූර්ණයෙන්ම ගැලවී බිම වැටී තිබුණු අතර ක්‍රීඩාපිටියේ පාරට අදාල කොටසෙහි වැට සම්පූර්ණයෙන්ම ගැලවී බිම වැටී තිබුණි. යොදා තිබූ දැල් සහ G.I බට කිසියම් පිරිසක් විසින් කපා රැගෙන ගොස් තිබුණු බව නිරීක්ෂණය විය. මෙම ඉදිකිරීම් කටයුතුවල මූලික සැලසුම් සිදුකිරීමේදී හා ස්ථානය තෝරා ගැනීමේදී ඇති විය හැකි ස්වාභාවික ආපදා තත්ත්වයන් පිළිබඳ සැලකිල්ලක් දක්වා නොතිබීම හේතුවෙන් සහ විධිමත් පරිදි ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබීම හේතුවෙන් මේ සඳහා වැයකළ රු.3,872,225 ක් වූ අගය නිෂ්කාර්ය වියදමක් ලෙස නිරීක්ෂණය විය | ව්‍යාපෘති නියමිත ප්‍රමිතීන්ට අනුව ඉදිකළ යුතුවන අතර, ඉදිකිරීම් කටයුතු කළමනාකරණය සහ නියාමනය සිදුකළ යුතු වීම. | අවුරුදු 25-50 ක පමණ කාලයකට පසුව බලාපොරොත්තු නොවූ අයුරින් ඇති වූ ගංවතුර ගැලීම වැනි ආපදා තත්වයක් නිසා එවැනි තත්වයක් උද්ගතවී ඇත. මෙම වැට නැවත සකස් කිරීම ආරම්භ කරන ලද අතර එම අවස්ථාවේදී, යාබද ඉඩමක් මිලදී ගැනීමට කටයුතු යොදා ඇති බැවින් සංවර්ධන කටයුතු නවත්වන මෙන් විදුලහල්පති විසින් දැනුම් දී ඇත. |
| (ආ) | නාරම්මල මයුරපාද විද්‍යාලයේ බහු ක්‍රීඩා ඒකකයක් ලෙස ක්‍රීඩා පිටිය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත වටිනාකම රු. 9,800,000 ක් විය. කොන්ත්‍රාත්කරු සමග 2016 ජනවාරි 06 දින ගිවිසුම් ගතවී රු. 8,057,370 ක් වූ අගයකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. අවසාන බිල්පත අනුව කල වැඩ වටිනාකම රු. 8,894,936 ක් වූයෙන් ගිවිසුම්ගත මුදල ඉක්ම වූ රු. 837,566 ක ගෙවීම් සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. බහු ක්‍රීඩා ඒකකයක් ලෙස නෙට්බෝල් සහ බාස්කට්බෝල් ක්‍රීඩා පිටියක් පමණක් ඉදිකර තිබුණු අතර වොලිබෝල් ක්‍රීඩා කිරීම සඳහා මෙම ක්‍රීඩා පිටිය භාවිතා කළ නොහැකි බව නිරීක්ෂණය විය. ඇස්තමේන්තුවේ සඳහන් රු. 2,722,768 ක් වටිනා වැඩ විෂයන් 19 ක් ඉටුකර නොතිබුණු අතර අවශ්‍යතා හඳුනාගෙන මනා සැලසුමකින් ව්‍යාපෘති සැලසුම් නොකිරීම සහ විධිමත් ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටුකිරීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය. | අවශ්‍යතා හඳුනාගෙන ව්‍යාපෘති නියමිත පරිදි සැලසුම් කිරීම හා නියාමනය සිදුකළ යුතුවීම සහ කොන්ත්‍රාත් පරිපාලනය විධිමත් පරිදි සිදුකළ යුතුය. | බහු ක්‍රීඩා ඒකකය සිදුකරනු ලබන කාර්යයන් නිසා පාසලේ ඉතිරි වැඩ කොටස් කරගෙන යාමට පසුව වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වෙන් කළ යුතු බව එවකට සිටි විදුහල්පති විසින් දැන් වූ නිසා එම වැඩ කොටස් ඉටු නොකරන ලදි. එසේ වූයේ පාසල සඳහා විධිමත් මූලික සැලැස්මක් නොතිබූ නිසාය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කුරුණෑගල මලියදේව පිරිමි විද්‍යාලයේ ප්‍රේක්ෂකාගාරය ඉදි කිරීම පුද්ගලික ඉදිකිරීම් සමාගමක් සමග රු. 14,296,005 ක් වූ අගයකට ගිවිසුම්ගතවී තිබුණි. නමුත් එම ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ මිල රු. 12,010,655 ක් විය. ඉදිරිපස ඇති ආසන සහ ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගත හැකිවන ආකාරයට ප්‍රේක්ෂකාගාරයේ වහලය ඉදිරියට පිහිටන ලෙස සකස් කර නොතිබුණි. මේ අනුව ඉදිරිපස ආසන සියල්ල වර්ෂාවට හා අව්රශ්මියට ආවරණය නොවන පරිදි ඉදිකිරීම සිදු කර තිබුණි. ඒ අනුව අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට හැකිවන ආකාරයට ප්‍රේක්ෂකාගාරයේ සැලැස්ම පිළියෙළ කර නොතිබුණු අතර, ව්‍යාපෘතිය සඳහා විධිමත් ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොමැති බවද නිරීක්ෂණය විය. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි හා අවශ්‍ය හා හඳුනාගෙන සැලැසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | මේ සඳහා රු.මිලියන 25 ක් වෙන්කර තිබූ නමුත් සුදුසුකම්ලත් ටෙන්ඩර්කරු විසින් ඉදිරිපත් කර තිබූ ලංසු මුදල රු.මි. 12 ක් වුවත් කල යුතු වැඩ කොටස් ඇතුලත්ව රු.මි.14.2 ක මුදලකට ප්‍රදානය කර ගිවිසුම අත්සන් කරන ලදී.<br>පාසලේ ඇති ආවෙ◌ිනික තත්වය සලකා බලා මෙම ගොඩනැගිලි ඉදිකර ඇති බවත් ඉදිරිපස අසුන් වෘත්ත (open tires) ආසන ලෙස දැක්විය හැක. එය සාමාන්‍ය ක්‍රීඩාගාරයක ඇති දෙයකි. |
| (ඇ) | පුත්තලම ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු වලට අදාළ ගෘහස්ථ ක්‍රීඩාගාරය හා ප්‍රධාන ක්‍රීඩාංගනය, මීටර් 400 ධාවන පථය සහ මීටර් 25 ක් දිග මංතීරු 06 ක් සහිත පිහිනුම් තටාකයේ ඉදිකිරීම් වැඩ සඳහා පුද්ගලික ඉදිකිරීම් සමාගම් 03 ක් සමග රු.162,241,004 අගයකට 2012 සැප්තැම්බර් 27 දින හා 2013 දෙසැම්බර් 31 දින ගිවිසුම් ගතවී තිබුණි. මෙම කොන්ත්‍රාත්වල කාලය පිළිවෙලින් 2018 මැයි 15, 2016 නොවැම්බර් 30 හා 2015 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව වැඩ නිම කළ යුතු දිනට වඩා වසර 05 ක් දක්වා ඉදිකිරීම් කටයුතු නිමකර භාරදුන් දිනය අතර සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. බාහිර ඉදිකිරීම් සහ මීටර 400 ධාවන පථයේ අමතර වැඩ කොන්ත්‍රාත් දෙකක් යටතේ ඉඩම් ගොඩකිරීම් සහ සංවර්ධන සංස්ථාව (REDECO) වෙත එකතුව රු.23,084,184 ක් වූ කොන්ත්‍රාත් අගයකට 2014 සැප්තැම්බර් 01 හා 2016 සැප්තැම්බර් 26 දින ප්‍රදානය කර තිබුණි. එම වැඩ 2014 දෙසැම්බර් 15 දින හා 2016 දෙසැම්බර් 31 දින අවසන් කළ යුතු වුවත් වර්ෂ 2 කට වඩා ප්‍රමාද කාලයක් සහිතව 2019 මාර්තු 23 දින වැඩනිම කර භාරදී තිබුණි. සම්පූර්ණ ඉදිකිරීම් කටයුතු වල ගිවිසුම්ගත එකඟ වූ මුළු කොන්ත්‍රාත් අගය ඉක්මවා රු.79,727,399 ක සැලකිය යුතු අතිරේක වැඩ හා ප්‍රමාණ විචලනයක් පැවතීම හේතුවෙන් රු.205,304,705 ක් වූ මුළු ඇස්තමේන්තු අගය රු.285,032,104 ක් දක්වා සංශෝධනය කර තිබුණි. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්රාත්කරුවන් වෙත ගෙවා තිබූ මුළු මුදල | - එම - | වැඩ නිම කර වසර කිපයක් වුවත් ඇති වූ දේශපාලන බලපෑම් නිසා භාර ගැනිමේ කටයුතු ප්‍රමාද විය. නමුත් මේ වන විට පුත්තලම නගර සභාව භාරගෙන ඇති අතර ක්‍රීඩික ක්‍රීඩිකාවන්ගේ ප්‍රයෝජනය සඳහා යොදවා නිසි ලෙස පරිහරනය කරමින් නඩත්තු කටයුතු සිදු කරනු ලබන බව කාරුණිකව දන්වමි. |

රු.276,560,406 ක් (බදු රහිත) විය. ඉදිකිරීම් වැඩ අවසන් කිරීමෙන් පසු ඉදිකිරීම් කටයුතුවල අඩුපාඩු රාශියක් පැවති අතර ඒවා නිවැරදි කර වසර කිහිපයක් ගතවී තිබුණද ක්‍රීඩා සංකීර්ණය ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවති අතර 2019 මාර්තු 22 දින මෙම ක්‍රීඩා සංකීර්ණය පුත්තලම නගර සභාව වෙත භාරදී තිබුණි. මේ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා විධිමත් පරිදි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබුණු අතර, ව්‍යාපෘතිය සැලසුම් කිරීම ඉදිකිරීම හා භාවිතයට ගැනීම සම්බන්ධයෙන් විධිමත් ව්‍යාපෘති කළමනාකරණයක් ද සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

**3.7 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රීඩා කෞශල්‍යා පුහුණු ව්‍යාපෘතිය සඳහා රු.9,266,400 ක් වූ ලයිට් මිසයිල ක්‍රීඩා උපකරණ ඒකක 1872 ක් රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව පුද්ගලික ක්‍රීඩා භාණ්ඩ සැපයුම් ආයතනයක් වෙතින් ඇනවුම් කර 2017 ජූලි 05 දින ගබඩාවට ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණු අතර වර්ෂ 2 ½ පමණ කාලයක් ගබඩාවේ රඳවා ගෙන ඇති 2020 දෙසැම්බර් 30 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණු මෙම තොගය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් විසින් ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි. | මෙම ප්‍රසම්පාදනයේ සිදුවූ වැරදි හා අඩුපාඩු සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීම සඳහා විධිමත් පරිදි පරීක්ෂණ කටයුතු සිදුකිරීම හා ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකළ යුතු වීම. | තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු විසින් කරන ලද විමර්ශණයක් මත පදනම්ව අදාල ලයිට් මිසයිල තොගය සැපයුම්කාර ආයතනය වෙත ආපසු යැවීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අනුමැතිය ලබා දී ඇත. |

4. තිරසර සංවර්ධනය
--------------------
මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව අන්තර්ජාලය හා අදාළ චක්‍රලේඛ මගින් දෙපාර්තමේන්තුව දැනුවත් වී තිබූ අතර තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක සඳහා ගැලපීම් සම්බන්ධ කෙටුම්පත සකසා තිරසර සංවර්ධන සභාව වෙත අමාත්‍යාංශය හරහා ඉදිරිපත් කර තිබුණි. තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශව වශයෙන් ක්‍රීඩා අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන, තිරසර සංවර්ධන සභාව, ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පොදු මහජනතාව හඳුනාගෙන තිබුණි. එසේම තිරසාර සංවර්ධන ඉලක්ක සම්බන්ධවන ක්‍රමවේදයන් හඳුනාගෙන තිබුණු අතර තිරසර සංවර්ධන ඉලක්ක ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සුදානම් වීම සම්බන්ධයෙන් මනා සැලසුම් සකස් කිරීම තුළින් ඒ සඳහා සුදානම් වීම කළ යුතු වීම. | තිරසර සංවර්ධන ඉලක්ක ඍජුව ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණද ඒ හා සම්බන්ධ ව්‍යාපෘති හා වැඩසටහන් එහි ඇතුළත්ව ඇත. |
| (ආ) | රාජ්‍ය අයවැය මගින් වාර්ෂිකව ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබාගත නොහැකිවීම හා ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම හේතුවෙන් තිරසර සංවර්ධන ඉලක්ක කරා ලඟාවීමට බාධා පැමිණෙන බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු සඳහා සුදානම් වීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මූල්‍ය කළමනාකරණය කාර්යක්ෂම ලෙස සිදුකළ යුතු වීම. | එකඟ වෙමි. |

5. මානව සම්පත් කළමනාකරණය
----------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක පුරප්පාඩු පැවති අතර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සඳහා බෙහෙවින් බලපානු ලබන මෙම පුරප්පාඩු බොහෝ කලක සිට පැවති බව නිරීක්ෂණය විය. | අත්‍යාවශ්‍ය තනතුරු අප්‍රමාදව පිරවීමට කටයුතු කළ යුතුවීම. | අධ්‍යක්ෂ (පාලන) තනතුර සඳහා 2020.01.20 දින හා ඉංජිනේරු තනතුර සඳහා 2020.10.12 දින නිලධාරියෙකු සේවයට වාර්තා කර ඇත. ගණකාධිකාරී තනතුර සම්පූර්ණ කිරීමට කටයුතු කරන |

| | | | |
|---|---|---|---|
| | | | ලෙසට 2018 වසරේ සිට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇත. |
| (ආ) | ක්‍රීඩා කටයුතු හා සම්බන්ධ තනතුරු 7 ක් සඳහා කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 38 ක් පැවතුණි. වර්ෂ 02 ක් හා ඊට අධික කාලයක සිට ක්ෂේත්‍රයේ සම්බන්ධ පුරප්පාඩු සඳහා කාර්යමණ්ඩලය පත් කර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා සංවර්ධන කටයුතුවල කාර්ය සාධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑහැකි බව විගණනයේදී නිරීක්ෂණය විය | ක්‍රීඩා ක්ෂේත්‍රයේ කාර්ය සාධනයට බලපානු ලබන මෙම පුරප්පාඩු අප්‍රමාදව පිරවීමට කටයුතු කළ යුතු වීම. | ක්‍රීඩා පුහුණුකරු තනතුරේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අයදුම්පත් කැඳවීමට කටයුතු කරමින් පවතී. ක්‍රීඩා නිලධාරීන් පුහුණුකරු තනතුරට උසස් කිරීමෙන් පසු ඇතිවන පුරප්පාඩු ද සමඟ නව ක්‍රීඩා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | පරිපාලන හා අනෙකුත් කටයුතු සම්බන්ධ තනතුරු 09 ක කාර්ය මණ්ඩල පුරප්පාඩු 47 ක් පැවතුණි. වර්ෂ 01-07 අතර කාලයක සිය පැවති මෙම පුරප්පාඩු ද පිරවීමට කටයුතු කර නොතිබුණි. | අප්‍රමාදව අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවීම | නිලධාරීන් ස්ථාන මාරුවීම මත විටින් විට පුරප්පාඩු ඇති වීමෙන් සංවර්ධන නිලධාරී හා කළමනාකරණ සේවා නිලධාරී තනතුරු සඳහා පුරප්පාඩු වී ඇත. . |